(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 13(14).]

# පාර්ලිමේන්තුවේ අංක 13 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා**

---

## 2015 මැයි මස 08 වැනි සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4579/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ කැසිනෝ සූදුව වෙනුවෙන් 2012 සිට මේ දක්වා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම කැසිනෝශාලා පවත්වාගෙන යනු ලබන ප්‍රදේශ කවරේද;

(iv) මේ වන විට බලපත්‍ර රහිත කැසිනෝශාලා පවත්වාගෙන යනු ලබන බවට වාර්තා වී තිබේද;

(v) එසේ නම්, එම කැසිනෝශාලා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4801/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින පුරා සේවය කරනු ලබන පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ සමස්ත සංඛ්‍යාව කොපමණද;

(ii) දීප ව්‍යාප්ත සේවය සඳහා අවශ්‍ය පවුල් සෞඛ්‍ය සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) හෙද කාර්ය මණ්ඩලයට සූතිකා පුහුණුව ලබාදීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(iv) සූතිකා පුහුණුව ලබාදීමට අදාළව හෙද හා පවුල් සෞඛ්‍ය සේවිකාවන් අතර ඇති වී තිබෙන ගැටලුව විසඳීමට ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4822/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ පිහිටා ඇති කඩ කාමර හා රථ ගාල ගැණුම්කරුවන්ට ලබාදීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(ii) ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකළේ නම්, ඒවා ලබාදුන් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පරිදි ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ අයගේ නම්, ලිපිනයන් සහ එක් එක් ටෙන්ඩර් අයදුම්පතෙහි සඳහන් මුදල වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ පිහිටි කඩ කාමර සහ රථ ගාලෙහි වර්තමාන හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම එක් එක් පුද්ගලයා විසින් එම කඩ කාමර සහ රථ ගාල ලබාගෙන ඇති මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5420/'14

ගරු අජිත් කුමාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, කුඹුක්කන් ඔය හරස් කර අක්කර 800ක ජලාශයක් ඉදිකිරීමට කටයුතු යොදා ඇති බවත්;

(ii) එම ජලාශය ඉදිකිරීම හේතුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ ගම්මිරිස් හා රබර් වගාවට දැවැන්ත බලපෑමක් සිදු වන බවත්;

(iii) එම නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික ක්‍රියාවලිය ඇන හිටින බවත්;

(iv) ජලාශය ඉදිකිරීම නිසා ප්‍රදේශයේ දැවැන්ත වන හානියක් හා පරිසර හානියක් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ජල යෝජනාක්‍රමයේ අපේක්ෂිත අරමුණු හා ඉලක්ක කවරේද;

(ii) එම ජලාශය ඉදිකිරීමෙන් ලහා කර ගැනීමට අපේක්ෂිත සංවර්ධනය කවරේද;

(iii) මෙම යෝජනාක්‍රමය සඳහා වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5578/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේදී බොරැල්ල ආයුර්වේද රෝහලෙහි නේවාසික රෝගීන් සඳහා තිබූ ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම රෝහලෙහි නේවාසික රෝගීන් සඳහා ඇති ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ එම රෝහලේ තිබූ ඇඳන් සංඛ්‍යාව අඩු වී තිබේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් වර්ෂ 2020 ට අදාළව සකසා ඇති කොළඹ නාගරික සැලැස්ම තුළ බොරැල්ල ආයුර්වේද රෝහල අන්තර්ගත වී තිබේද;

(ii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5848/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ, අංක 32, කුප්පියාවත්ත බටහිර කොට්ඨාසයට අයත්, මාළිගාකන්ද පටුමග, වරිපනම් අංක 59 සහ 59/8 දරන ස්ථානය අසලින් ඇති ප්‍රවේශ මාර්ගයේ අනවසර ඉදිකිරීමක් කර තිබීම නිසා ප්‍රදේශවාසීන්ට නොයෙකුත් බාධා සිදු වෙමින් පවතින බව දන්නේද;

(ii) කොළඹ මහ නගර සභාවේ ඇතැම් නිලධාරීන්ගේ අනුග්‍රහය මත සිදු කර ඇති එකී නීති විරෝධී ඉදිකිරීම් ඉවත් කොට පදිංචිකරුවන්ගේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5942/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලවල නම්, තනතුරු, ලිපිනයන් හා දුරකථන අංක දන්නේ ද;

(ii) එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ලේකම්වරයාගේ සේවා කාලය වෙන් වෙන් වශයෙන් කොපමණ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6016/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රබර් වගාකරුවන් දිරිගැන්වීමට පසුගිය වර්ෂය තුළ ගත් පියවර කවරේද;

(ii) රබර් සඳහා වන සහතික මිල රබර් නිෂ්පාදකයින් වෙත ලබාදෙන යාන්ත්‍රණය කවරේද;

(iii) රබර් සඳහා වන වෙළඳපොළ මිල සහ සහතික මිල අතර පරතරය පියවා ගැනීමට රජය පෞද්ගලික ආයතනයක් සම්බන්ධ කර ගන්නේද;

(iv) මේ වන විට නව සහතික මිල ක්‍රමවේදය ක්‍රියාත්මක වන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6023/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝකයේ විවිධ රටවල්වල ඇති ශ්‍රී ලාංකිකයන් සතු බැංකු ගිණුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගිණුම්වල ඇති වටිනාකම එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී ගිණුම් හිමියන් ශ්‍රී ලංකාවේ නීති උල්ලංඝනය කරමින් එම ගිණුම්වල මුදල් තැන්පත් කර තිබේද;

(iv) එසේ නම්, එවැනි ගිණුම් පිළිබඳව තොරතුරු කවරේද;

(v) ඉහත කී සියලු ගිණුම්වල තොරතුරු ලබා ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් අදාළ බැංකුවලින් ඉල්ලීම් කර තිබේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vii) එකී ගිණුම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

(viii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මවිසින් මීට ඉහත අවස්ථාවකදී ස්විට්සර්ලන්තයේ HSBC බැංකුවේ ඇති ගිණුම් පිළිබඳව පාර්ලිමේන්තුවේදී කළ විමසුමට ලබා දුන් පිළිතුරෙහි මූල්‍ය බුද්ධි අංශයට අදාළ නීති අවශ්‍ය පරිදි සංශෝධනය කරගත යුතු බවට සඳහනක් වූයේද;

(ii) එසේ නම්, ඒ අනුව එකී නීති මේ වන විට සංශෝධනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6033/'15

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සේවයේ යොදවා ගත හැක්කේ එක් ලේකම්වරයෙකු පමණක් බවත්;

(ii) එම ලේකම් තනතුරේ වර්ෂ 12ක් සේවය කළ කේ. කේ. ජී. පද්මා මහත්මිය 2010.08.12 දින සිට එකී තනතුරෙන් මාරුකර යවා ඇති බවත්;

(iii) එකී මාරු කිරීමට හේතුව හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මහතා විසින් අනුමත සීමාව ඉක්මවා භාවිතා කළ වාහනවල ධාවන සටහන් අත්සන් කිරීම ඇය විසින් ප්‍රතික්ෂේප කිරීම බවත්;

(iv) ඇය එම තනතුරේ කාර්යය නියමයක් නොමැති තත්ත්වයට පත්කර, වෙනත් අයෙකු වැඩ බලන ලේකම්වරියක වශයෙන් පත්කර මාසික දීමනාවක් ගෙවන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ තනතුරට පත් කළ පුද්ගලයෙකු සිටියදී දීමනා ගෙවා තවත් අයෙකු සේවයේ යොදා ගැනීම සම්පූර්ණ නීති විරෝධී ක්‍රියාවක් නොවන්නේද;

(ii) කේ. කේ. ජී. පද්මා මහත්මිය නැවත අදාළ තනතුරෙහි සේවයේ යොදවා ඇයට අහිමි කළ උසස්වීම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6038/'15

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හලාවත සහ පුත්තලම ශ්‍රී ලංගම ඩිපෝවල සේවය කළ ඩිපෝ කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන් කිසිදු චෝදනාවක් නොමැතිව එම තනතුරුවලින් ඉවත් කර ඇති බවත්;

(ii) එම තනතුරු සඳහා අවම වශයෙන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට හෝ පෙනී නොසිටි, වෙනත් කිසිදු සුදුසුකමක් ද නොමැති අය පත්කර ඇති බවත්;

(iii) එසේ නුසුදුසු පුද්ගලයින් පත් කිරීම නිසා එම ආයතන පිරිහෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ (i)හි සඳහන් තනතුරුවලින් ඉවත් කළ අය නැවත පත්කර, යහපාලනයට ආදර්ශයක් ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6040/'15

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුගවෙල මධ්‍ය විද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම, මහනුවර ආනන්ද විද්‍යාලයේ දෙමහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ මැදගොඩ, පූජාපිටිය ජනාධිපති ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම යන ව්‍යාපෘති සඳහා පසුගිය වර්ෂයේ දී මුදල් වෙන් කළ බවත්;

(ii) එම ව්‍යාපෘතිවලට අදාළ ඉදිකිරීම් මේ වන විට අඩ වශයෙන් නිම වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වත්මන් රජය විසින් ඉහත සඳහන් ව්‍යාපෘතීන් නවතා දමා තිබේද;

(ii) එසේ නම්, එම පාසල්වල දරුවන්ගේ යහපත වෙනුවෙන් එම ඉදිකිරීම් ව්‍යාපෘති නැවත ආරම්භ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4823/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත් වායු සමනය කළ සුඛෝපභෝගී වාහන නාවික හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත් සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4837/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාත් සභාව මගින් පාලනය කරනු ලබන රෝහල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(ii) එම එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍යවරු, හෙදියන්, රෝහල් කම්කරුවන් හා අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් රෝහලේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5579/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ වන විට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පාලනය වන ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් රෝහල්වල නම් කවරේද;

(ii) එම රෝහල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) 2013 වර්ෂය තුළදී ඉහත එක් එක් රෝහල වෙතින් ප්‍රතිකාර ලබා ගෙන ඇති බාහිර රෝගීන් සංඛ්‍යාව සහ නේවාසික රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 මැයි මස 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4824/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත්, වායු සමනය කළ, සුඛෝපභෝගී වාහන යුද හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත්, සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා යුද හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5580/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආයුර්වේද වෛද්‍යවරු සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථාව සකසන ලද වර්ෂය කවරේද;

(ii) එම සේවා ව්‍යවස්ථාව අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iii) එය සංශෝධනය නොකළේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5943/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 06/2011 චක්‍රලේඛය අනුව ජනාධිපති, අගමැති කථානායක, කැබිනට් අමාත්‍ය, විපක්ෂ නායක, නියෝජ්‍ය අමාත්‍ය, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති, ව්‍යාපෘති අමාත්‍ය, දිස්ත්‍රික් හා රාජ්‍ය අමාත්‍ය, කැබිනට් අමාත්‍යාංශ ලේකම්, පළාත් සභාවක ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් යනාදී තනතුරුධාරීන්ගේ ලේකම්වරුන්ට විශ්‍රාම වැටුප් හිමිකම ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයට හා මේ වන විට එකී විශ්‍රාම වැටුප සම්බන්ධව වලංගුව පවතින සියලු චක්‍රලේඛ හා උපදෙස්වල තොරතුරු ඇතුළත් ගොනුවක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) මේ වන විට ඉහත සඳහන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගන්නා පිරිස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6034/'15

ගරු විජිත හේරත් මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමියෝපති පනත අනුව වර්ෂ 2006 - 2011 දක්වා කාල සීමාව සඳහා පත්කර තිබූ හෝමියෝපති වෛද්‍ය සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 සහ 14 වගන්තිවලට පටහැනිව 2009.10. 29 දින විසුරුවා හැර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් 2006 වර්ෂයේ පත්වූ එකී වෛද්‍ය සභාවේ සාමාජිකයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්;

(iii) විසුරුවන ලද වෛද්‍ය සභාව වෙනුවට එවකට විෂයභාර අමාත්‍යවරයා විසින් නීත්‍යානුකූල නොවන අතුරු කමිටුවක් පත් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් පත් කිරීම අනුමත කරන්නේද;

(ii) එම අතුරු කමිටුව විසින් සිදු කළ අංක 184 සිට 275 දක්වා වෛද්‍යවරුන් ලියාපදිංචිය තුළින් හෝමියෝපති පනත උල්ලංඝනය වී තිබේද;

(iii) එසේ නම්, එම පත්වීම් අවලංගු කරන්නේද;

(iv) අවලංගු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හෝමියෝපති පනතේ 20 වැනි වගන්තිය යටතේ ලේඛකාධිකාරීවරයෙකු පත්කිරීමට වෛද්‍ය සභාවකට පමණක් ඇති බලය අභිබවා එවකට පැවති දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම්. ඒ. පෙරේරා මහතාව ලේඛකාධිකාරී ලෙස පත්කිරීම නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, එම පත්කිරීම නිවැරදි කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6039/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය මගින් සංවිධානය කර තිබූ 2015 දැයට කිරුළ වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කය සඳහා වූ නිවාස ආධාර වැඩපිළිවෙළට අදාළව ඇහැලියගොඩ ඡන්ද කොට්ඨාසයේ ඇහැලියගොඩ, කිරිඇල්ල හා කුරුවිට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ඉල්ලුම්කරුවන් 1000 වැඩි පිරිසකගෙන් ඉල්ලුම්පත් ලැබී තිබුණේද;

(ii) එකී ඉල්ලුම්පත් අනුව සකසනු ලැබූ ඇස්තමේන්තු මත අදාළ භාණ්ඩ සැපයීම සඳහා මිල ගණන් හෝ ටෙන්ඩර් කැඳවීමේ කාර්යය රත්නපුර දිස්ත්‍රික් ලේකම්වරයා වෙත යොමු කර තිබුණේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම නිවාස ආධාර බලාපොරොත්තුවෙන් සිටින අඩු ආදායම්ලාභීන් එම ආධාර වැඩපිළිවෙළ වත්මන් රජය විසින් අවලංගු කර තිබේදැයි විමසන බව නිලධාරීන් ඇතුළු වගකිවයුත්තන් දන්නේද;

(ii) ඒ පිළිබඳව අදාළ නිලධාරීන්ගෙන් විමසා බලා තොරතුරු ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6041/'15

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි මාසයේ පැවති මිලට සාපේක්ෂව මේ වන විට සාදික්කා මිල 30% - 40%ක් අතර ප්‍රමාණයකින් පහළ ගොස් ඇති බව දන්නේද;

(ii) එලෙස සාදික්කා මිල පහළ යෑමට හේතුව කවරේද;

(iii) නිරන්තරයෙන් සිදුවන සාදික්කා මිල පහළ වැටීම වළක්වා ගැනීමට යම් පියවරක් ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය අයවැයට සාපේක්ෂව මෙවර අයවැයෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන 50%කින් පමණ අඩුකර ඇති බව දන්නේද;

(ii) ප්‍රතිපාදන අඩු කිරීම හේතුවෙන් අපනයන කෘෂිකර්මාන්තයන්හි සිදුවන පසුබෑම මග හරවා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6043/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට ,— (1)

(අ) (i) යාපනය මහනගර සභාව සඳහා අලුතින් ඉදිකිරීමට නියමිත ගොඩනැගිල්ලට වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) එහි පළමුවැනි අදියරේ වැඩ කටයුතු ආරම්භ කර තිබේද;

(iii) එම පළමුවැනි අදියර සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6048/'15

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) තඹලගමුව ප්‍රාදේශීය සභාව විසින් පුරාවිද්‍යාත්මක ස්ථාන විවිධ පොදු අවශ්‍යතා වෙනුවෙන් යොදා ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) තඹලගමුව, යුනිට් 17 කොලනියේ තිබූ පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් දාගැබ් දෙකක නටඹුන් වනසමින් ළමා උද්‍යානයක් ඉදිකළේ කෙසේද;

(ii) ඊට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොවුනේ මන්ද;

(iii) තඹලගමුව - තිස්සපුර ග්‍රාමයේ පිඹුරු අංක ත්‍රී 51 අතිරේක අංක 16, පත්‍ර අංක 16, කැබලි අංක 576 යන පුරාවිද්‍යාත්මක භූමිය ආසන්නයේ පිහිටි සුසානභූමිය පුළුල්කිරීම මුවාවෙන් කම්බි ගසා වෙන්කර ගැනීමට කරන උත්සාහය කවර පදනමක් මත, කුමන පාර්ශ්වයකගේ අවශ්‍යතාවයකට සිදු කරන්නේද;

(iv) භික්ෂූන්වහන්සේලා ප්‍රමුඛ ප්‍රදේශවාසීන් ඊට විරෝධය පෑමෙන් පසු එකී පුරාවිද්‍යා භූමිය ඔස්සේ කුඹුරුවලට යාමට තිබූ මාර්ගය අවහිර කරමින් වැටක් ඉදිකිරීම කවර පාර්ශ්වයකින් පලිගැනීම සඳහා සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නැගෙනහිර පළාතේ බෞද්ධ නටඹුන් විනාශ කිරීමට පළාත් පාලන ආයතනවලට ඉඩදීමට හේතුව කවරේද;

(ii) එවැනි සිදුවීම් සම්බන්ධව පුළුල් පරීක්ෂණයක් සඳහා ඊට සම්බන්ධ හෝ අනුබල දුන් පුද්ගලයන්ට එරෙහි ක්‍රියාමාර්ග ගන්නේ ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4828/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර මහ රෝහලට තම ප්‍රථම පත්වීම ලැබූ එහි ප්‍රධාන හෙද නිලධාරිනිය වන මල්කාන්ති ද සිල්වා මහත්මිය මේ වන විට ස්ථාන මාරුවීම්වලින් තොරව එම රෝහලේම වර්ෂ 21 ක් පමණ සේවය කර ඇති බවත්;

(ii) එම හෙද නිලධාරිනිය අවස්ථා කිහිපයකදී ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයේ හෙද සේවයේ නියුතු වූ අයට ස්ථාන මාරුවීම් ලබා දීමේදී රජය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය කවරේද;

(ii) ඉහත අ (ii) හි පරිදි ස්ථාන මාරුවීම ඉල්ලා තිබියදීත්, රජයේ හෙද ස්ථාන මාරු ලබා දීමේ ප්‍රතිපත්තිය මල්කාන්ති ද සිල්වා මහත්මියට වලංගු නොවීමට හේතු කවරේද;

(iii) අදාළ ස්ථාන මාරුවීම් ලබා දීමේ ප්‍රතිපත්තියට අනුව ඇයට ස්ථාන මාරුවීමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඇයට, ඇය ඉල්ලුම් කරන ස්ථානයට ස්ථාන මාරුවීමක් දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5581/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වත්මන් ආයුර්වේද වෛද්‍ය කොමසාරිස්වරයාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම නිලධාරියාට ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ඇති සුදුසුකම් කවරේද;

(iii) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරියෙකුට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තුළ ලබා ගත හැකි ඉහළම වෘත්තීයමය තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5944/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය, කොඩ්බේ පිහිටි ජාතික ජල සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් නිලධාරි නිවස්නය ශ්‍රී ලංකා නාවික හමුදාවේ පරිහරණයට ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ත්‍රිකුණාමලය හා තදාසන්න ප්‍රදේශවල රාජකාරි කටයුතුවල නියැලීමේදී, නාරා ආයතනයේ පර්යේෂකයන්ට ප්‍රයෝජනයට ගැනීමට තිබූ ඉහත සඳහන් නිවස්නය සිවිල් පරිපාලනය ස්ථාපනය වී ඇති අවස්ථාවක තවදුරටත් නාවික හමුදාව භාරයේ තැබීමේ අවශ්‍යතාවයක් තිබේද;

(ii) එම නිවස්නය යළි නාරා ආයතනයට පවරා නොගන්නේද;

(iii) එම පවරා ගැනීම සිදු කරන්නේ නම්, එම දිනය කවරේද;

(iv) එම නිවස්නය යළි නාරා ආයතනයට පවරා ගන්නා තෙක්, නාරා ආයතනයේ පර්යේෂකයන්ට හා නිලධාරීන්ට එම ප්‍රදේශයේ රාජකාරි කිරීමේ දී නවාතැන් පහසුකම් සලසා දෙන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6042/'15

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් යොවුන් සේනාංක සහ රැකියා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා පසුගිය වර්ෂයේදී හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ මුදල් වෙන් කළබවත්;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර මේ වන විට අඩක් නිම වී ඇති බවත්;

(iii) වත්මන් රජය විසින් එම ව්‍යාපෘතිය නවතා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හාරිස්පත්තුව ප්‍රදේශයේ අනාගත දරු පරපුරේ යහපත උදෙසා ඉහත සඳහන් ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6045/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඇති මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ග අතරින් අළුත්වැඩියා කිරීමට නියමිත මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එකී මාර්ග අළුත්වැඩියාවට අදාළව ව්‍යාපෘති හඳුනා ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ව්‍යාපෘති සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිවලට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4829/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගොඩ උයන්ගොඩ I අත හා II අත ඇතුළු ග්‍රාම නිලධාරී වසම් කිහිපයක වගා අස්වනුවලට වඳුරන්ගෙන් සහ මොනරුන්ගෙන් සිදුවන හානි වළක්වාගත නොහැකි වීම නිසා කෘෂිකාර්මික කටයුතුවල නියුතු ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවට පත්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වගාවන්ට සිදුවන හානි වැළැක්වීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා ඉදිරියේදී අනුගමනය කරන ක්‍රමවේදයන් කවරේද;

(iii) මෙම වගාවන් ආරක්ෂා කරදීම සඳහා කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5945/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DODD/HO/2/Admin/පත්කිරීම් හා 2015.02.05 දිනැති ලිපියෙන් යූ. අනුර එස්. වීරරත්න මහතා (ශ්‍රී. ලං. ක්‍රම සම්පාදන සේවයේ I) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරට පත් කර ඇති බවත්;

(ii) පසුව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන)ගේ අංක DODD/HO/2/Admin/පත්කිරීම් හා 2015.02.19 දිනැති ලිපියෙන් එකී පත් කිරීම නැවත සංශෝධනය කරමින් ඒ මහතාව එකී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ, අධ්‍යක්ෂ (ප්‍රජා මූල සංවිධාන) තනතුරට පත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වීරරත්න මහතාට ඉහත (අ) (i) හි සඳහන් තනතුර ලබා නොදීමට ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහ සමෘද්ධි විෂයයට අදාළ නොවන අමාත්‍යවරයෙකුගේ දේශපාලන මැදිහත්වීමක් සිදුවී තිබේද;

(ii) එවැනි මැදිහත්වීමක් සිදුවී ඇත්නම්, එය අනුමත කරන්නේද;

(iii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි විෂයට අදාළ කටයුතු ඉඩම් අමාත්‍යවරයාට පවරා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුර සඳහා යූ. අනුර එස්. වීරරත්න මහතා පත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 මැයි මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4996/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව පැවැත්වුනු කාලසීමාව තුළ කොළඹ නගර සභා සීමාවෙන් ඉවත් කරනු ලැබූ සුනඛයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සුනඛයින් රැගෙන ගොස් දැමූ ස්ථානය කවරේද;

(iii) එම ස්ථානයේදී සුනඛයින් සඳහා නිසි පරිදි වාසස්ථාන හා ආහාරපාන සපයනු ලැබුවේද;

(iv) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි සුනඛයින් රැගෙන ගොස් දැමීම සම්බන්ධයෙන් සත්ත්ව සංවිධාන සමග ඇති කර ගත් එකඟතා කවරේද;

(ii) එලෙස එකඟතා ඇති කර ගත් සත්ව සංවිධාන කවරේද;

(iii) එම එකඟතාවලින් ඉටු කළ හා නොකළ එකඟතා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත පරිදි ගෙන ගොස් දැමූ සුනඛයින් දැනට රඳවා සිටින ප්‍රදේශය කවරේද;

(ii) ඉදිරියේදී එම සුනඛයින් සම්බන්ධව කටයුතු ඉටුකරනු ලබන්නේ කෙසේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5575/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට ක්‍රියාත්මක වන ආයුර්වේද පනත හඳුන්වා දුන් වර්ෂය කවරේද;

(ii) මේ වන විට එම පනත සංශෝධනය කර ඇති වාර ගණන කොපමණද;

(iii) එය අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iv) මෙතෙක් එම පනත සංශෝධනය කර නොමැති නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් හඳුන්වනු ලබන්නේ වෛද්‍ය නිලධාරීන් ලෙස ද; නැතහොත්, වෛද්‍ය වෘත්තිකයන් ලෙස ද;

(ii) ඔවුන් එම නාමයෙන් හැඳින්වීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5906/'15

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගේ ශ්‍රමය යොදා ගැනීමේදී ඔවුන්ට වේතනයක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම වේතනය කොපමණද;

(iii) එම වේතනය අවසාන වරට සංශෝධනය කළ දිනය කවරේද;

(iv) වර්තමාන තත්ත්වයන්ට අනුව එම වේතනය වැඩි කළ යුතුව තිබෙන බව දන්නේද;

(v) බ්‍රිතාන්‍යය වැනි රටවල සිරකරුවන් සඳහා මසකට පවුම් 200 ලබා දෙන වාතාවරණයක් තුළ මෙරට සිරකරුවන්ට දැනට ලබා දෙන වේතනය වැඩි කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5913/'15

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආර්ථික සංවර්ධන, ඵලදායිතා ප්‍රවර්ධන ඇතුළු එවකට පැවති අමාත්‍යාංශ කිහිපයක් අහෝසි කර එම අමාත්‍යාංශයන්ට අනුයුක්තව සේවය කළ සංවර්ධන නිලධාරීන් ඉටු කළ කාර්යයන් අත්හිටුවා ඇති බවත්;

(ii) එබැවින් එම නිලධාරීන් දහස් ගණනක් මේ වන විට කිසිදු රාජකාරියක් නොමැතිව සිටින බවත්;

(iii) ඔවුන්ට කාර්යාල පවත්වාගෙන යෑමට රජයෙන් ලබා දී තිබූ දීමනාවද මේ වන විට අහෝසිකර ඇති බවත්;

(iv) එම හේතුවෙන් බදු පදනම මත භාවිතා කළ කාර්යාල ගොඩනැගිලිවලින් ඉවත්වීමට සිදුවී ඇති බවත්;

(v) එබැවින් එම කාර්යාලවලට ලබා දී තිබූ රජයේ දේපළ අනාරක්ෂිත තත්ත්වයකට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් කරුණු සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) ඉහත සඳහන් අමාත්‍යාංශයන්හි දැනට සේවය කරන සංවර්ධන නිලධාරීන් සහ බඳවා ගත් උපාධිධාරීන් විධිමත් ලෙස රාජ්‍ය සේවයට ඇතුළත් කොට උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දෙන බවට දින 100 වැඩසටහනෙහි සඳහන් පොරොන්දුව පරිදි එම නිලධාරීන් දින 100 ඇතුළතදී ඵලදායී කාර්යයක යොදවන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5916/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.08 දින පැවති ජනාධිපතිවරණයෙන් පසු දේශපාලනික හෝ වෙනයම් හේතු මත පොලිස් හෝ වෙනත් ආරක්ෂක අංශවල පරීක්ෂාවන්ට ලක්වූ කතෝලික දේවස්ථාන, හින්දු ආගමික ස්ථාන සහ මුස්ලිම් දේවස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ පරීක්ෂාවට ලක්කළ එක් එක් අදාළ ආගමික ස්ථානයේ නම, ලිපිනය, දුරකථන අංකය පරීක්ෂාවට ලක් කළ දිනය සහ ඊට අදාළ වූ හේතුන්, කතෝලික, හින්දු සහ මුස්ලිම් යන ආගමික ස්ථාන අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6018/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ රහසිගත රැඳවුම් කඳවුරු තිබේද;

(ii) එසේ නම්, එම කඳවුරු පිළිබඳ විස්තර කවරේද;

(iii) එම කඳවුරුවල රඳවා තබා සිටින රැඳවියන් කවුරුන්ද;

(iv) ඔවුන් පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

6036/ 15

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජිනීවාහි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත තනතුරෙහි සිටි තමරා කුනනායගම් මහත්මිය වර්ෂ 1989 සිට 1990 දක්වා කාල පරිච්ඡේදය තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නියෝජිතවරියක ලෙස කටයුතු කළ බවට "ස්වර්ණවාහිනී" නාලිකාව සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කළේද;

(ii) එසේ නම්, එකී ප්‍රකාශය සිදු කරන ලද්දේ කවර සාක්ෂි පදනම් කරගෙනද;

(iii) එකී සාක්ෂි වැදගත්කමකින් යුතුයැයි සළකනු ලබන්නේ නම්, කුනනායගම් මහත්මිය නෙරපීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් කාල පරිච්ඡේදය තුළ සහ ඒ ආසන්න කාලයේදී කුනනායගම් මහත්මිය මානව හිමිකම් ක්‍රියාකාරිණියක් වශයෙන් කටයුතු කළ බවත්, ඇය අමාත්‍යවරයා ද සම්බන්ධවී සිටි ''මව්වරුන්ගේ පෙරමුණ'' නමැති සංවිධානයේ ක්‍රියාකාරකම්වලට සහයෝගය දක්වමින් කටයුතු කළ බවත් එතුමා දන්නෙහිද?

(ඇ) කුනනායගම් මහත්මිය ත්‍රස්තවාදයට අනුකම්පාව දක්වන බවට චෝදනා කිරීමට හේතුව වන්නේ ඇය මානව හිමිකම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී වීමද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

4998/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමේ තරග විභාගය 2006 වර්ෂයේදී පැවැත්වූ පසු නැවත පවත්වනු ලැබුවේ 2012 වර්ෂයේදී බවත්;

(ii) එම නිසා විභාගයට පෙනී සිටිය හැකි උපරිම වයස් සීමාව වන අවුරුදු 28 සීමා ගැටලුවට මුහුණ දෙන, සුදුසුකම් සපුරනු ලැබූ පිරිසක් සිටින බවත්;

(iii) උපරිම වශයෙන් දෙවරක් පෙනී සිටිය හැකි විභාගයට වයස් සීමාව පිළිබඳ ගැටලුව නිසා ඇතැමුන් එක් වරක් පමණක් පෙනී සිට ඇති අතර, ඇතැමෙකුට එක් වරක් හෝ පෙනී සිටීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ) (ii) හි වයස් සීමා ගැටලුවට මුහුණ පා සිටින සුදුසුකම්ලත් පිරිසට ලබා දෙන සහන කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2014.02.28 දින වන විට රාජ්‍ය අංශයේ ආයතනයන්හි පැවති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත පුරප්පාඩු ප්‍රමාණය පිරවීමේදී 2012 වර්ෂයේ තරග විභාගයට පෙනී සිටි, සමත්වීමට අවශ්‍ය නියමිත ලකුණු ප්‍රමාණය ලබා ගත් අයදුම්කරුවන්ට අවස්ථාව ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5576/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂයේ උපාධිධාරීන්ට රැකියා ලබාදීම සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී ඒ සඳහා ඉල්ලුම් කර තිබූ ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් රැකියා ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011.12.31 දින වන විට රැකියා විරහිතව සිටි ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2012 වර්ෂයේදී ඔවුන්ට රැකියා ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකසා තිබුනේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iv) ඒ යටතේ රැකියා ලබා දුන් ආයුර්වේද වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5756/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අග්නිදිග විශ්වවිද්‍යාලයේ, සමන්තුරේ පීඨයේ පීඨමණ්ඩල රැස්වීමේදී සිංහල භාෂාවෙන් අදහස් නොදක්වන ලෙස පීඨාධිපතිවරයා පවසා ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන්ගේ භාෂා අයිතිය අහිමි වී ඇති බවත්;

(iii) මෙම නියෝගය ජාතිවාදය වැපිරීමක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අග්නිදිග විශ්වවිද්‍යාලයේ සිංහල සිසුන්ගේ භාෂා අයිතිය සුරක්ෂිත කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) උක්ත පීඨාධිපතිගේ (අ)(i) හි සඳහන් නියෝගයට එරෙහිව අමාත්‍යාංශය ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?